කො/දේවි බාලිකා විද්‍යාලය

පළමු වාර පරීක්ෂණය - 2014

බුද්ධ ධර්මය - I

11 ශ්‍රේණිය | කාලය පැය 02

- පළමු ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගත් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.

01) කෙටි පිළිතුරු සපයන්න.

1. "මෙසේ මහත් සෘද්ධි ඇති මෙසේ මහත් ආනුභාව ඇති ගෞතමයන්ට විද්‍යාලෝපන්ට කරන ලදැයි මෙසේ තොපගේ කල්‍යාණ වූ යසගොස් උස්ව නැගේ."

   මෙය කවරෙකු විසින් කා හට කරන ලද ප්‍රකාශයක්ද ?

2. ගාථා 423 ක් ඇති ධම්මපදය ඒවා තේමා 26 යටතේ වග්ග වශයෙන් සංග්‍රහ කොට ඇත. ඔබට නියමිත ධම්ම පද ගාථා අයත් වග්ග දෙකක් සඳහන් කරන්න.
3. 'උද්ධච්ච කුක්කුච්චය' යන්නෙහි අර්ථය ලියා දක්වන්න. එය උපමා කර ඇත්තේ කවරක වද ?
4. බුදුරජාණන් වහන්සේ වදාළ ලෝකධාතු ත්‍රිත්වය නම් කරන්න.
5. ආදී කාලීන කැටයම්වල බුදුන්වහන්සේ සංකේතවත් කිරීමට භාවිතා කළ දෑ 2 ක් ලියන්න.
6. භික්ෂු ජීවිතය පවත්වා ගැනීමට අවශ්‍ය මූලික කරුණු හතරක් සිව්පසය නමින් බුදු දහමෙහි පෙන්වා දී ඇත. එම කරුණු මොනවාද ?
7. අධිපති ධර්ම තුන නම් කරන්න.
8. බුද්ධ ප්‍රතිමා නිර්මාණයේදී භාවිතා කළ මුද්‍රා දෙකක් නම් කරන්න.
9. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ප්‍රඥාවට අයත් අංග දෙක් නම් කරන්න.
10. බුදු දහමට අනුව සසර සැරිසරන සත්වයා කර්මානු රූපව උපත ලබන ලෝක තුන නිවැරදිව සඳහන් කරන්න.

02)

1. බුදු දහමෙහි දැක්වෙන දෙයාකාර භාවනාව සඳහන් කරන්න.
2. සමථ භාවනාව පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.
3. විදර්ශනා භාවනාව යන්න හඳුන්වා එය නිවන් ලබා ගැනීමට හේතුවන අයුරු දක්වන්න.

03)

1. "වරං වෙ නාධිගච්ජෙය්‍ය" යන ධම්ම පද ගාථාව ලියන්න.
2. එම ගාථාවේ තේරුම ලියන්න.
3. යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා උසස් පැවතුම් ඇති අය ආශ්‍රය කිරීමේ අගය පැහැදිලි කරන්න.

04)

1. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාවේ ඉදි වූ ප්‍රථම දා ගැබ කුමක්දැයි නම් කරන්න.
2. "ථූපාරහ පුද්ගලයන්" තිදෙනෙක් නම් කරන්න.
3. මහින්දාගමනයෙන් අප ලත් දායාදයන් තුනක් නම් කර ඉන් එකක් පිළිබඳ ඇගයීමක් කරන්න.

05)

1. මෛත්‍රී වැඩීමට අදාළ කරුණු ඇතුළත් සූත්‍ර දේශනාව කුමක්ද ?
2. එහි දැක්වෙන පරිදි මෛත්‍රී වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් කෙටියෙන් විස්තර කරන්න.
3. සාමකාමී සමාජයක් ගොඩනැගීමට මෛත්‍රී සහගත පැවැත්ම ඉවහල්වන අයුරු පැහැදිලි කරන්න.

06)

1. ආර්ය අෂ්ටාංගික ප්‍රතිපදාවට අයත් වන සම්මා දිට්ඨි මාර්ග අංගය සැකෙවින් හඳුන්වන්න.
2. දුක්ඛ ආර්ය සත්‍ය ප්‍රභේද වන ආකාරය දක්වන්න.
3. චතුරාර්ය සත්‍ය ධර්මය වදිනෙදා ජීවිතය ගත කිරීමේදී මතුවන ගැටළු මැනවින් හඳුනාගැනීමට තේරුම් ගැනීමට නිරාකරණය කර ගැනීමට හේතුවන අයුරු පැහැදිලි කරන්න.

07) පද්මාකාර ජීවිතයක් ගොඩනගා ගැනීම සඳහා බුද්ධ චරිතයෙන් මෙන්ම ශ්‍රාවක චරිතවලින් ආදර්ශ ගත හැකි ය.

1. පද්මාකාර ජීවිතය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න
2. පද්මාකාර ජීවිතයට බුද්ධ චරිතයෙන් ගතහැකි ආදර්ශ තුනක් නම් කරන්න.
3. අටලෝ දහමින් කම්පා නොවන්නෙකු තුළ ඇති ගුණාංග කීපයක් දක්වා එම ගුණාංග ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට යොදාගත හැකි අයුරු පැහැදිලි කරන්න.